# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org

## ඡන්දය දිනයේ මාධ්‍ය නිවේදනය 1

2015 ජනාධිපතිවරණය සඳහා වූ ඡන්ද විමසීම ප. ව. 7 ට ආරම්භ විය. මෙම කාලය ඇතුළත යාපනයේ පේදුරුතුඩුවෙන් පිපිරීමක් පිළිබඳ එක් සිද්ධියක් වාර්තා වී ඇත. එම පිපිරීම සිදු වූයේ අත් බෝම්බයක් නිසා බවත් ඉන් කිසිවෙකුට තුවාල සිදු වූයේ නැති බවත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට දන්වනු ලැබිණ. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට 200 ක් පමණ ඡන්ද දායකයින් ඡන්දය දීමෙන් වලකනු ලැබූ බවට වාර්තා විය. පුත්තලමේ නාගවිල්ලු හා හුසේනියාවල වාසය කරන ඔවුන්ගේ ඡන්ද පොළවල් පිහිටා තිබෙන්නේ මන්නාරමේ ය. පුත්තලම නගරාධිපති කේ. ඒ. බායිස් මහතා හා ඔහුගේ ආධාරකරුවන් විසින් බස් දිවීම වළක්වනු ලැබූ නිසා ඔවුන්ට ඡන්දය දීමට යාමට හැකිවී නැත. ඉකුත් රාත්‍රියෙහි සිට බායිස් මහතා හා ඔහුගේ ආධාරකරුවන් ලංගම හා පෞද්ගලික බස් රියදුරන්ට තර්ජනය කර ඔවුන් මෙම ගම්වලින් යාම වළක්වා ඇත.

ඡන්ද දායකයින් ඔවුන්ගේ ඡන්ද බලය ක්‍රියාවට නැගීමෙන් වළකනු ලැබ ඇති බව සැලකිල්ලට ගත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානය මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්නැයි අධිකාරීන්ගෙන් ඉල්ලා සිටී. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානය කඩිනම් පියවර ගන්නැයි ඉල්ලා සිටිමින් ප්‍රශ්නය මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළේ ය. ඔහු තත්ත්වය පිළිබඳව දැනුවත්ව සිටින බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට දැනුම් දුනි.

ඡන්ද දායකයින් බිය වැද්දීමට දරන ලද ප්‍රයත්නයන් පිළිබඳ සිද්ධීන් ගණනාවක් පිළිබඳ වාර්තා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට ලැබිණ. පෙ. ව. 7.30 - 8. 30 අතර මාතර වැලිගම අරෆා ප්‍රාථමික පාසලේ ඡන්ද මධ්‍යස්ථානයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දෙන්නැයි ඡන්දදායකයින්ට බලපෑම් කිරීමට උත්සාහ දරා ඇත.

එසේම මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානය ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දය දීමේ පෝලිම්වල රහස්‍යව ඡන්දය දීමේ පිළිවෙළක් නොතිබූ හා ඡන්ද මධ්‍යස්ථානය තුළ හා පිටත සිටින පුද්ගලයින්ට ඡන්දය දෙනු දර්ශනය කළ හැකි ප්‍රදේශ ගණනාවක් ද පැවති බව සටහන් කර ගති. මෙය වාර්තා වූ ප්‍රදේශවලට මාතර (40 -41 ඡන්ද මධ්‍යස්ථාන), පොතුවිල් (64 ඡන්ද මධ්‍යස්ථානය) හා මුලතිව් (77 ඡන්ද මධ්‍යස්ථානය) යන ප්‍රදේශ ඇතුළත් විය.

මැතිවරණ නීතිය යටතේ තහනම් කරනු ලැබ තිබීම නොතකා ඡන්දය පැවැත්වීමේ දිනයෙහි ඡන්ද ව්‍යාපාර කටයුතු කර ගෙන යාම පිළිබඳ වාර්තා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට දිගටම ලැබෙමින් පැවතිණ. ලැබුණු ඇතැම් වාර්තාවලට ඉල්ලීමක් නොමැති එස්එම්එස් පණිවිඩ සංසරණය කරවීම ද ඡන්ද මධ්‍යස්ථාන තුළ හා අවට ප්‍රචාරක ද්‍රව්‍ය බෙදා හැරීම ද ඇතුළත් ය. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට එවැනි පැමිණිලි ගණනාවක් ලැබුණු අතර ඒ සියල්ලම එක්සත් ජනතා නිදහස් සන්ධානයට එරෙහිව ය. ඒවාට පහතින් එන ඒවා අඩංගු ය.

- +94766887347 දුරකතන අංකයෙන් බුලත් කොළයට ඡන්දය දෙන ලෙස සිංහලෙන් එස්එම්එස් පණිවිඩ විශාල ප්‍රමාණයක් යැවීම. පරිශීලක දුරකතනය හා සම්බන්ධ වීමට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානය උත්සාහ කළ ද කිසිවෙකු ප්‍රතිචාර දැක්වූයේ නැත.

- +778313850 දුරකතන අංකයෙන් ඡන්දය වර්ජනය කරන්නැයි ඉල්ලා දෙමළෙන් එස්එම්එස් පණිවිඩ විශාල ප්‍රමාණයක් යැවීම. +775478817 හා +770217836 යන අංකවලින් අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේනට ඡන්දය නොදෙන්නැයි ඉල්ලා යවන ලද එස්එම්එස් පණිවිඩ පිළිබඳ වාර්තා ද මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට ලැබිණ.

- කෑගල්ලේ, දැරණියගල, දැරණියගල කණිෂ්ඨ විද්‍යාලයේ අංක 23 ඡන්ද මධ්‍යස්ථානය අවට පෙ. ව. 8.00 ට පමණ එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටීම.

- පෙ. ව. 7.05 ට රත්නපුර, බලංගොඩ ඇල්ලේපොළ මහා විද්‍යාලයේ අංක 10 ඡන්ද මධ්‍යස්ථානය අසල එක්සත් ජනතා නිදහස් සන්ධාන පත්‍රිකා බෙදා හරිනු ලැබීම.

- පෙ. ව. 8.30 ට නාඳුනන කණ්ඩායමක් රත්නපුර, ඇහැලියගොඩ අංක 40 ඡන්ද මධ්‍යස්ථානයට යන පාරේ ඡන්ද දායකයින්ට ඔවුන්ගේ ඡන්දය බුලත් කොළයට (එක්සත් ජනතා නිදහස් සන්ධානයට) දෙන්නැයි උපදෙස් අඩංගු පත්‍රිකා බෙදා හැරීම.

- පුත්තලමේ දඹදෙනිය අංක 36 බොගවලාන ඡන්ද මධ්‍යස්ථානයේ දී ත්‍රිරෝද රථයකින් (NW AH 3788) පැමිණ සිටි කුඩා කණ්ඩායමක් එක්සත් ජනතා නිදහස් සන්ධානයට සහය ඉල්ලන මුද්‍රිත පත්‍රිකා බෙදා හැරීම,

- කුරුණෑගල වැඋඩ කණිෂ්ඨ විද්‍යාලයේ අංක 04 ඡන්ද මධ්‍යස්ථානයෙන් මීටර 100 ක් පමණ ඈතින් පුද්ගලයින් කණ්ඩායමක් බුලත් කොළය සහිත එක්සත් ජනතා නිදහස් සන්ධාන පත්‍රිකා බෙදා හැරීම.

- ත්‍රිකුණාමලයේ ඉරක්කන්ඩිවල හම්රා මුස්ලිම් මහා විද්‍යාලයේ අංක 75 ඡන්ද මධ්‍යස්ථානය අවට මීටර 500 ක් ඇතුළත පෙ. ව. 7 පමණ සිට ජනාධිපති රාජපක්ෂට කතිරය ගැසූ ව්‍යාජ ඡන්ද පත්‍රිකා ඡන්ද දායකයින්ට බෙදා දීම. බදුල්ල දිස්ත්‍රික්කයේ වියලුව ඡන්ද කොට්ඨාසයේ සොරනාතොට ප්‍රාථමික විද්‍යාලයේ අංක 14 ඡන්ද මධ්‍යස්ථානය අසල ද එසේ බෙදූ බවට වාර්තා ලැබී ඇත.

**ජනවාරි 8 වෙනි දින- ඡන්ද දායකයින් පෞද්ගලික බස්වලින් ඡන්ද පොළවලට ප්‍රවාහනය කරනු ලැබ ඇත.**

පෙ. ව. 8. 05 ට පමණ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් හා සිවිල් ආරක්ෂක භටයින්ගෙන් සමන්විත පුද්ගලයින් දහ දෙනෙකු විසින්  මුලතිව්වල කිරිබ්බන්වැව විද්‍යාලයේ අංක 84 ඡන්ද මධ්‍යස්ථානයට ඡන්ද දායකයින් ගෙන යනු ලැබූ බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂක මධ්‍යස්ථානයට දන්වනු ලැබිණ. ඔවුන් ගෙන ගොස් ඇත්තේ HT6173 අංක දරණ පෞද්ගලික බසයෙනි.

මැතිවරණ හා සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ සිද්ධි නිරීක්ෂණය කිරීම සඳහා වන ස්වාධීන හා නිර් පාක්ෂික සංවිධානයක් ලෙස මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) පිහිටුවන ලද්දේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ( FMM ) හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සන්ධානය විසින් 1997 දී ය. වර්තමානයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සැකසී ඇත්තේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා ඉන්ෆෝර්ම් මානව හිමිකම් ප්‍රලේඛන කේන්ද්‍රය එක්ව ය.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ වාර්තා හා ප්‍රකාශනවලට www.cmev.org වෙතින් පිවිසිය හැකි ය.

ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු